FMM SRI LANKA
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
Free Media Movement

# මාධ්‍ය නිදහස: නිරීක්ෂණ වාර්තාව
## ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை
## Media Freedom Rights Monitoring Report

MFRMD

2023 මාර්තු

3 වන වෙළුම - කලාප අංක 03


අරගලයේ ක්‍රියාකාරිකයකු මාස 10කට පසු අත්අඩංගුවට!


ශාන්ත විජේසූරියට පොලිසිය පහරදෙයි


හූ කියා විරෝධය පළ කළැයි අත්අඩංගුවට

**මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම්, පූර්ව සිදුවීම්වල වර්ධනයන් හා ඒවාට අදාළ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ. මාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනතාවගේ භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම්, නව නීති පැනවීම්, නීති ප්‍රතිසංස්කරණ සහ අදාළ ප්‍රස්තුතයන් පිළිබඳව ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පළ වන ප්‍රතිචාර යනාදිය කෙරෙහිද මෙහිදී අවධානය යොමු කෙරේ. මාධ්‍ය නිදහස පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය උපයෝගී කර ගන්නා විෂය පථයට/සංරචකයන්ට අදාළ සිදුවීම් 21ක් 2023 මාර්තු මාසයේදී නිරීක්ෂණය විය. ආරක්ෂාව හා සුරක්ෂිතබව යන සංරචකයට අයත් සිදුවීම් 10ක්, නීතිමය කොන්දේසි යන සංරචකය යටතට ගැනෙන සිදුවීම් 7ක් සහ ව්‍යුහාත්මක කොන්දේසි යන සංරචකයට අදාළ සිදුවීම් 4ක් ඒ අතර වෙයි.**

## නිරීක්ෂණය වූ සිදුවීම්

1. ජාතික ජන බලවේගයේ විරෝධතාවට එල්ල කළ ප්‍රහාරය සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසමට පැමිණිලි දෙකක් ඉදිරිපත් කිරීම.
2. මැතිවරණයට වෙන් කර ඇති මුදල් රඳවා තබාගැනීම වළක්වාලමින් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය තහනම් නියෝගයක් නිකුත් කිරීම.
3. මහනුවර ගෝඨාගෝගම ක්‍රියාකාරිකයකු, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගනු ලැබීම.
4. සමාජ මාධ්‍ය සන්නිවේදකයකු වූ මනෝරම වීරසිංහ ප්‍රශ්න කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීම.
5. ශ්‍රී ලංකාවේ අදහස් පළ කිරීමේ නිදහසට එරෙහි ප්‍රමුඛ අවියක් වන කඳුළුගෑස් භාවිතය පිළිබඳ පර්යේෂණ වාර්තාවක්, සමාජය හා සාමයික කේන්ද්‍රය (CSR) විසින් එළිදැක්වීම.
6. දඹුල්ල ප්‍රාදේශීය මාධ්‍යවේදී නිමල් ජයරත්නට දුරකථනයෙන් මරණ තර්ජන එල්ල කිරීම.

7. කොළඹ විශ්වවිද්‍යාලය තුළට පොලිසිය එල්ල කළ කඳුළුගෑස් ප්‍රහාර හේතුවෙන් විශ්වවිද්‍යාලයේ ආරක්ෂක නිලධාරියකු මරණයට පත් වීම.

8. කොළඹ විශ්වවිද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමය පැවැත්වූ විරෝධතාවකට පොලිසිය කඳුළුගෑස් හා ජල ප්‍රහාර එල්ල කිරීම.

9. කැලණිය විශ්වවිද්‍යාලය ඉදිරිපිට පැවති සිසු උද්ඝෝෂණයකට පොලිසිය, ජල හා කඳුළුගෑස් ප්‍රහාර එල්ල කිරීම සහ සිසුන් 6 දෙනෙකු අත්අඩංගුවට ගැනීම.

10. උද්ඝෝෂණවලදී භාවිත කරන කඳුළුගෑස්වල ප්‍රමිතිය හා ඒවා භාවිත කරන ආකාරය පිළිබඳව වාර්තාවක් සපයන ලෙස අධිකරණය පොලිසියට නියෝග කිරීම.

11. උද්ඝෝෂණයක් වාර්තා කිරීමට ගිය, සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයකුට රූපවාහිනී නාලිකාවක මාධ්‍යවේදීන් පිරිසකගෙන් බාධා එල්ල වීම.

12. උද්ඝෝෂණ විසුරුවාහැරීම සඳහා පොලිසිය භාවිත කරන කඳුළු ගෑස් සහ ජලයේ ප්‍රමිතිය පිළිබඳව පිළිතුරු අපේක්ෂාවෙන් ප්‍රශ්නාවලි දෙකක් නීතිඥ කණ්ඩායමක් විසින් පොලිස් මූලස්ථානය වෙත භාර දීම.

13. මෑතකදී පැවැත්වුණු මහජන උද්ඝෝෂණවලදී එල්ල කළ කඳුළුගෑස් ප්‍රහාර සම්බන්ධයෙන් තොරතුරු දැනගැනීමේ පනත යටතේ පොලිස් මූලස්ථානයෙන් තොරතුරු ඉල්ලා සිටීම.

14. සමාජ මාධ්‍ය ඔස්සේ පළ කළ වීඩියෝවක් සම්බන්ධයෙන් සිය ජීවිතයට තර්ජන එල්ල වී ඇතැයි, සමාජ මාධ්‍ය සන්නිවේදකයකු මානව හිමිකම් කොමිසමට පැමිණිලි කිරීම.

15. සියත රූපවාහිනියේ ටෙලිවැකිය වැඩසටහනෙන් පාර්ලිමේන්තු වරප්‍රසාද කඩ වී ඇතැයි කියන චෝදනාව පාර්ලිමේන්තුවේදී විවාදයට ලක් වීම.

16. ඇමති බන්දුල ගුණවර්ධනට හූ කියා විරෝධය පළ කළ පුද්ගලයකු අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීම.

17. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සේවකයින්ට ස්වේච්ඡාවෙන් ඉල්ලා අස්වීම සඳහා වැඩපිළිවෙළක් ප්‍රකාශයට පත් කිරීම.

18. ගෝඨාගෝගමට සහ මයිනාගෝගමට පහරදීම සම්බන්ධයෙන් දේශබන්දු තෙන්නකෝන් සැකකරුවකු ලෙස නම් කරන්නැයි ඉල්ලා අභියාචනාධිකරණය හමුවේ ගොනු කර තිබූ පෙත්සම නිෂ්ප්‍රභ කිරීම.

19. වසන්ත මුදලිගේ නිදහස් කිරීමට එරෙහිව නීතිපතිවරයා මහාධිකරණයට අභියාචනයක් ගොනු කිරීම.

20. වෙබ් අඩවියක පළ කළ පුවත් සම්බන්ධයෙන් එහි සංස්කාරකවරයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ප්‍රශ්න කිරීම.

21. මිරිහානේ පැවති විරෝධතාවක් වාර්තා කරමින් සිටියදී මාධ්‍යවේදී ශාන්ත විජේසූරියට පොලිස් නිලධාරීන් පිරිසක් පහරදීම සහ විරෝධතාකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගැනීම.

**1 වගුව: වාර්තා වූ සමස්ත සිදුවීම් - 2023 මාර්තු**

| ආවරණය කර ඇති සංරචකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 10 |
| නීතිමය කොන්දේසි | 07 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 04 |
| **එකතුව** | **21** |

## ආරක්ෂාව සහ සුරක්ෂිතබව

**මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමේ වාතාවරණයක් පැවතීම ජනමාධ්‍ය නිදහස පිළිබඳ මූලික කොන්දේසියකි. එමෙන්ම ජනමාධ්‍ය නිදහස හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා වීමට නම්, පුරවැසියන්ට අනිටු ප්‍රතිවිපාකවලට මුහුණදීමේ අවදානමකින් තොරව ජනමාධ්‍ය ඔස්සේ හෝ වෙනත් ආකාරවලින් නිදහසේ අදහස් පළ කළ හැකි වාතාවරණයක් පැවතිය යුතුය. සාමාකාමීව රැස්වීමේ, විරෝධය පළ කිරීමේ හා උද්ඝෝෂණවල නිරත වීමේ නිදහසද අදහස් පළ කිරීමේ නිදහසට අයත් වේ. මෙම මූලික නිදහස උල්ලංඝනය වූ අවස්ථා 10ක් මාර්තු මාසයේදී නිරීක්ෂණය විය. සාමකාමී උද්ඝෝෂණවලට එරෙහිව පොලිසිය අනීතික ලෙස බලය පාවිච්චි කිරීමේ සිදුවීම්වල වර්ධනයක් පෙන්නුම් කරන අතර උද්ඝෝෂණයකට එල්ල කළ කඳුළුගෑස් ප්‍රහාරයකින් එක් අයකු ජීවිතක්ෂයට පත්ව තවත් විශාල පිරිසක් ප්‍රතිකාර ලැබූහ. යුද හමුදාව නිල වශයෙන් වගකීම බාර නොගන්නා, පොලු රැගත් හමුදා කණ්ඩයක් ශිෂ්‍ය උද්ඝෝෂණයකට එරෙහිව ක්‍රියාත්මක වීම බරපතළ තත්ත්වයකි.**

**2 වගුව: 2023 මාර්තු: ආරක්ෂාව සහ සුරක්ෂිතබව - සිදුවීම් 10**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| ජීවිත හානි / ඝාතන | 01 |
| පහරදීම් | 03 |
| මානසික බලපෑම් | 06 |
| **එකතුව** | **10** |

01. **සමාජ මාධ්‍ය සන්නිවේදකයකු වූ මනෝරම වීරසිංහ ප්‍රශ්න කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීම.**

සමාජ මාධ්‍ය ඔස්සේ සිදු කළ අදහස් පළ කිරීමක් සම්බන්ධයෙන් ඔහු මාර්තු 7 වැනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත කැඳවා ප්‍රශ්න කර තිබේ. මීට පෙර අවස්ථාවකදීද ඔහු මෙලෙසම ප්‍රශ්න කිරීමට ලක් කෙරිණි. මාධ්‍ය නීති සංසදය එහිදී මාධ්‍ය සන්නිවේදකයාගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටියේය.

මූලාශ්‍රය: MFRM Desk

02. **දඹුල්ල ප්‍රාදේශීය මාධ්‍යවේදී නිමල් ජයරත්නට දුරකථනයෙන් මරණ තර්ජන එල්ල කිරීම.**

හමුදා නිලධාරීන් සම්බන්ධ නිදන් හෑරීමේ සිදුවීමක් වාර්තා කළ ආකාරයටම දිඹුලාගල ආරණ්‍ය සේනාසනයේ භික්ෂූන් සම්බන්ධ නිදන් හෑරීමේ සිද්ධියක්ද වාර්තා නොකළහොත් මාධ්‍යවේදියා හා පවුලේ අය ඝාතනය කරන බව එම තර්ජනාත්මක පණිවුඩයෙන් ප්‍රකාශ කර තිබේ. මාර්තු 5 වැනිදා රාත්‍රී 8ට පමණ හමුදා සාමාජිකයකු ලෙස ඇඟවූ පුද්ගලයකු මෙම තර්ජනය සිදු කොට ඇති අතර, එම ඇමතුම පටිගත කරගත් මාධ්‍යවේදියා ඒ පිළිබඳව මනම්පිටිය පොලිසිය වෙත පැමිණිලි කර ඇත.

මූලාශ්‍රය: MFRM Desk

03. **කොළඹ විශ්වවිද්‍යාලය තුළට පොලිසිය එල්ල කළ කඳුළුගෑස් ප්‍රහාර හේතුවෙන් විශ්වවිද්‍යාලයේ ආරක්ෂක නිලධාරියකු මරණයට පත් වීම.**

මාර්තු 7 වැනිදා කොළඹ ලිප්ටන් වටරවුමෙන් ආරම්භ කළ විරෝධතා පෙළපාලිය කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨය අසලින් ගමන් ගනිමින් තිබියදී පොලිසිය ඊට ජල හා කඳුළුගෑස් ප්‍රහාර එල්ල කළ අතර, ආරක්ෂාව සඳහා විශ්වවිද්‍යාලය තුළට දිවගිය සිසුන්ට එළවා බැටන් ප්‍රහාර එල්ල කරන ලදි. කඳුළුගෑස් ප්‍රහාරවලින් නීති පීඨය තුළ අධ්‍යයන කටයුතුවල නිරතව සිටි සිසුන්ද පීඩාවට ලක් වූ අතර, සරසවියේ අභ්‍යන්තර ආරක්ෂක නිලධාරියකු ජීවිතක්ෂයට පත් විය. මෙම උද්ඝෝෂණය මර්දනය කිරීම සඳහා කැඳවා තිබූ හමුදා ඇඳුමට සමාන ඇඳුමකින් සැරසුණු ලී සහ යකඩ පොලු රැගත් කණ්ඩායමක් පිළිබඳව දැඩි ආන්දෝලනයකට ලක් වූ අතර, යුද හමුදා ප්‍රකාශකවරයා ප්‍රකාශ කළේ එම පිරිස හමුදා සාමාජිකයන් නොවන බවයි. විශ්වවිද්‍යාලය තුළට පොලිසිය ඇතුළුවීම හා ප්‍රහාරය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමය දැඩි ලෙස විරෝධය පළ කළේය.

මූලාශ්‍රය: sinhala.adaderana.lk, www.youtube.com

04. **කොළඹ විශ්වවිද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමය පැවැත්වූ විරෝධතාවකට පොලිසිය කඳුළුගෑස් හා ජල ප්‍රහාර එල්ල කිරීම.**

අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලය මාර්තු 7 වැනිදා කොළඹදී පැවැත්වූ විරෝධතාවට පොලිසිය කළ පහරදීම සහ කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයට කැරලි මර්දන නිලධාරීන් ඇතුළුවීමට එරෙහිව මාර්තු 8 වැනිදා මෙම විරෝධතාව පැවැත්විණි. පොලිසිය අවස්ථා තුනකදී ඊට කඳුළු ගෑස් සහ ජල ප්‍රහාර එල්ල කළ අතර පාසල් සිසුන් හා සාමාන්‍ය ජනතාවද එයින් පීඩාවට පත් විය.

මූලාශ්‍රය: sinhala.newsfirst.lk

05. **කැලණිය විශ්වවිද්‍යාලය ඉදිරිපිට පැවති සිසු උද්ඝෝෂණයකට පොලිසිය, ජල හා කඳුළුගෑස් ප්‍රහාර එල්ල කිරීම සහ සිසුන් 6 දෙනෙකු අත්අඩංගුවට ගැනීම.**

කැලණිය විශ්වවිද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමයේ සභාපති කැළුම් මුදන්නායක සහ දිල්ෂාන් හර්ෂණ යන සිසුන් අත්අඩංගුවේ තබාගැනීමට විරෝධය පළ කරමින් මාර්තු 8 වැනිදා සවස මෙම උද්ඝෝෂණය පැවැත්විණි. පොලිසිය අවස්ථා කිහිපයකදීම කඳුළුගෑස් හා ජල ප්‍රහාර එල්ල කළ අතර අත්අඩංගුවට ගත් සිසුන් 6 දෙනා මහර මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රු. 50,000 බැගින් වූ ශරීර ඇප මත මුදාහැරිණි. අදාළ නඩුව ජූලි 13 වැනිදා යළි කැඳවීමට නියමිතය.

මූලාශ්‍රය: www.youtube.com

**06. උද්ඝෝෂණයක් වාර්තා කිරීමට ගිය, සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයකුට රූපවාහිනී නාලිකාවක මාධ්‍යවේදීන් පිරිසකගෙන් බාධා එල්ල වීම.**

'ටෝක් විත් ලාල්' නැමති යූටියුබ් නාලිකාව පවත්වාගෙන යන සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයකු වූ ලාල් පෙරේරා, මාර්තු 22 වැනිදා පිටකොටුවේ පැවති උද්ඝෝෂණයක් වාර්තා කරමින් සිටියදී මෙම සිදුවීමට මුහුණ පා ඇත. තමන් රජයේ මාධ්‍ය හැඳුනුම්පතක් සහිත මාධ්‍යවේදියෙකු ලෙස හඳුන්වාදුන් පුද්ගලයෙක්, ලාල් පෙරේරා සතුව මාධ්‍ය හැඳුනුම්පතක් තිබේදැයි ප්‍රශ්න කරමින් ඔහුගේ ජංගම දුරකථනය උදුරාගෙන, වාර්තාකරණය වළක්වා තිබේ. පසුව සෙසු මාධ්‍යවේදීන් මැදිහත්ව සිදුවීම සමථයකට පත් කර ඇත. ලංකාවේ ජනමාධ්‍ය හැඳුනුම්පත් සම්බන්ධයෙන් විවාදාත්මක තත්ත්වයක් පවතින අතර, ජනමාධ්‍යවේදීන් ලෙස කටයුතු කිරීමට හැඳුනුම්පතක් තිබිය යුතු යැයි නියමයක් නොමැත.

මූලාශ්‍රය: sinhala.asianmirror.lk

**07. සමාජ මාධ්‍ය ඔස්සේ පළ කළ වීඩියෝවක් සම්බන්ධයෙන් සිය ජීවිතයට තර්ජන එල්ල වී ඇතැයි, සමාජ මාධ්‍ය සන්නිවේදකයකු මානව හිමිකම් කොමිසමට පැමිණිලි කිරීම.**

ගෝල්ෆේස් අරගලයේ ක්‍රියාකාරිකයකු හා සමාජ මාධ්‍ය සන්නිවේදකයකු වන ශෂික දිසානායක විසින්, මාර්තු 14 වැනිදා මෙම පැමිණිල්ල ඉදිරිපත් කරන ලදි. මාර්තු 7 වැනිදා අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලය කොළඹදී පැවැත්වූ උද්ඝෝෂණය විසුරුවාහැරීමට පැමිණි පොලු රැගත් හමුදා කණ්ඩය පිළිබඳව හෙළි කරමින්, එම පොලු රැගෙන ඒමේ දර්ශන ඔහු සිය ෆේස්බුක් පිටුවේ පළ කර තිබිණි. එම පළ කිරීමෙන් පසුව තමන් පැහැරගෙන යෑමේ හා ජීවිතය අනතුරක් සිදු කිරීමේ සැලසුමක් ඇතැයි ඔහු ප්‍රකාශ කරයි.

මූලාශ්‍රය: www.youtube.com

**08. වෙබ් අඩවියක පළ කළ පුවත් සම්බන්ධයෙන් එහි සංස්කාරකවරයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ප්‍රශ්න කිරීම.**

ආරක්ෂක ලේකම්, පොලිස්පති හා බන්ධනාගාර ප්‍රධානියකුට අදාළව පළ පුවත් සම්බන්ධයෙන්, ravanalankanews.lk වෙබ් අඩවියේ සංස්කාරක නිශ්ශංක මායාදුන්නේ මාර්තු 28 වැනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත කැඳවා මෙලෙස ප්‍රශ්න කර තිබේ. තමන්ගෙන් පැය 3 1/2 කට අධික කාලයක් ප්‍රශ්න කළ බවත්, එහිදී අදාළ තොරතුරු ලැබුණු ආකාරය පිළිබඳව විමසූ නමුත් තමන් ඒ පිළිබඳ හෙළි කිරීම ප්‍රතික්ෂේප කළ බවත් ඔහු ප්‍රකාශ කළේය.

මූලාශ්‍රය: www.facebook.com/Newspedia.lk

**09. සියත රූපවාහිනියේ ටෙලිවැකිය වැඩසටහනෙන් පාර්ලිමේන්තු වරප්‍රසාද කඩ වී ඇතැයි කියන චෝදනාව පාර්ලිමේන්තුවේදී විවාදයට ලක් වීම.**

මේ සම්බන්ධයෙන් සොයාබැලීම සඳහා කතානායකවරයා විසින් පත් කරන ලද තේරීම් කාරක සභාවේ වාර්තාව සම්බන්ධයෙන් මාර්තු 21 වැනිදා පාර්ලිමේන්තුවේදී උණුසුම් සංවාදයක් පැවැත්විණි. වරප්‍රසාද කඩ වී ඇත්තේ කෙසේදැයි එම වාර්තාවේ සඳහන් නොවන අතර, චෝදනාව සම්බන්ධයෙන් සිය අදහස පළ කිරීමට ජනමාධ්‍යවේදියාට අවස්ථාවක් ලබා දී නොමැති බවත් එහිදී මන්ත්‍රීවරුන් විසින් පෙන්වා දෙන ලදි. විවේචනය කිරීමේ හා මත පළ කිරීමේ අයිතිය ජනමාධ්‍යයට ඇති බව රාජ නීතිඥ නඩේසන්ගේ නඩුව උපුටා දක්වමින් නීතිපතිවරයා මෙම වාර්තාවේ සඳහන් කර ඇති බව පා.ම. ලක්ෂ්මන් කිරිඇල්ල ප්‍රකාශ කළේය. මෙම වාර්තාව විදුලි සංදේශ නියාමන කොමිසමට සහ නීතිපතිවරයාට යොමු කිරීමට නිර්දේශ කිරීමද දැඩි විවේචනයට ලක් විය.

මූලාශ්‍රය: www.youtube.com

**10. මිරිහානේ පැවති විරෝධතාවක් වාර්තා කරමින් සිටියදී මාධ්‍යවේදී ශාන්ත විජේසූරියට පොලිස් නිලධාරීන් පිරිසක් පහරදීම සහ විරෝධතාකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගැනීම.**

ගෝල්ෆේස් අරගලයේ ක්‍රියාකාරිකයින් උද්ඝෝෂණයක් සඳහා මිරිහාන ප්‍රදේශයට රැස්ව සිටියදී පොලිස් නිලධාරීන් විශාල පිරිසක් බලය යොදවා උද්ඝෝෂකයින් විසුරුවාහැරීමට උත්සාහ දැරීමෙන් උණුසුම් තත්ත්වයක් හටගැනිණි. මෙය අවස්ථාව රූගත කරමින් සිටියදී ශාන්ත විජේසූරියට මෙම ප්‍රහාරය එල්ල විය. අනුරුද්ධ බණ්ඩාර, ධානිෂ් අලි සහ සුධාර යන ක්‍රියාකාරිකයින් මෙහිදී පොලිස් අත්අඩංගුවට ගැනුණු අතර පසුව කිසිදු චෝදනාවකින් තොරව නිදහස් කෙරිණි.

මූලාශ්‍රය: www.youtube.com

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 07ක් මාර්තු මාසය තුළ නිරීක්ෂණය විය. භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහසට එරෙහිව පොලිසිය විවිධාකාරයෙන් ක්‍රියාත්මක වූ අවස්ථා මෙන්ම, වින්දිත පාර්ශ්වයන් ඊට ප්‍රතිචාර වශයෙන් ගත් ක්‍රියාමාර්ගද ඊට අයත් වෙයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගෙන ඇති අදහස් පළ කිරීමේ අයිතියට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතියද අයත් වන බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පිළිගෙන ඇති කරුණකි. (දේශප්‍රිය - කරුණාතිලක එදිරිව මැතිවරණ කොමසාරිස් හා තවත් 13 දෙනෙක් (1999-1-SLR-157) රජය පළාත් පාලන මැතිවරණ නොපැවැත්වීමට දරන උත්සාහයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දී තිබෙන නියෝගයද අදහස් පළ කිරීමේ අයිතිය පිළිබඳ විෂයපථයට අයත් වන බැවින් මෙම වාර්තාවට ඇතුළත් කර ඇත.**

**3 වගුව: 2023 මාර්තු: නීතිමය කොන්දේසි - සිදුවීම් 07**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| නීතිමය ක්‍රියාමාර්ග | 07 |
| **එකතුව** | **07** |

01. **ජාතික ජන බලවේගයේ විරෝධතාවට එල්ල කළ ප්‍රහාරය සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසමට පැමිණිලි දෙකක් ඉදිරිපත් කිරීම.**

පෙබරවාරි 26 පස්වරුවේ පැවැත්වූ විරෝධතා පෙළපාලියට ජල, කඳුළුගෑස් හා බැටන් ප්‍රහාර එල්ල කොට 28 දෙනෙකුට තුවාල සිදු කර එක් අයෙකු ජීවිතක්ෂයට පත් කිරීම සම්බන්ධයෙන් ජාතික ජන බලවේගය විසින් මාර්තු 02 වැනිදා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට පැමිණිලි දෙකක් ඉදිරිපත් කෙරිණි.

එම ප්‍රහාරයෙන් මිය ගිය නිමල් අමරසිරි වෙනුවෙන් සහ එහිදී ප්‍රහාරයට ලක්වූ නීතිඥ සඳුන් යාපා කරුණාරත්න වෙනුවෙන් එම පැමිණිලි ගොනු කර ඇත.

ආරක්ෂක ලේකම් කමල් ගුණරත්න, පොලිස්පති සී.ඩී වික්‍රමරත්න, බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් ඇතුළු 20 දෙනෙකු මෙම ප්‍රහාරයෙහි වගඋත්තරකරුවන් ලෙස නම් කර තිබේ.

මූලාශ්‍රය: lankatruth.com

02. **මැතිවරණයට වෙන් කර ඇති මුදල් රඳවා තබාගැනීම වළක්වාලමින් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය තහනම් නියෝගයක් නිකුත් කිරීම.**

2023 අයවැයෙන් පළාත් පාලන මැතිවරණ කටයුතු සඳහා සහ රජයේ මුද්‍රණාලය සඳහා වෙන් කර ඇති මුදල් ප්‍රතිපාදන රඳවා ගැනීම වළක්වාලමින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මුදල් අමාත්‍යංශයේ ලේකම්වරයා හා නීතිපතිවරයා වෙත මාර්තු 03 වැනිදා තහනම් නියෝග දෙකක් නිකුත් කෙරිණි.

සමගි ජන බලවේගයේ මහලේකම් රංජිත් මද්දුමබණ්ඩාර විසින් ඉදිරිපත් කළ මූලික අයිතිවාසිකම් පෙත්සමක් විභාගයට ගැනීමට අවසර දෙමින් ප්‍රීති පද්මන් සුරසේන, ජනක් ද සිල්වා සහ ප්‍රියන්ත ප්‍රනාන්දු යන ත්‍රිපුද්ගල ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ල විසින් මෙම නියෝගය දෙනු ලැබීය.

මුදල් අමාත්‍යංශයේ ලේකම්වරයාට සහ ජනාධිපතිවරයා වෙනුවෙන් නීතිපතිවරයා අදාළ පෙත්සමේ වගඋත්තරකරුවන් ලෙස නම් කර තිබේ. මැයි මස 26 වැනිදා පෙත්සම් විභාගය සිදු කිරීමට නියමිතය.

ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වෙන අදහස් පළ කිරීමේ මූලික අයිතියට ඇතුළත් වන බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පිළිගෙන තිබේ. (1999-1-SLR-157)

මූලාශ්‍රය: www.bbc.com

03. **මහනුවර ගෝඨාගෝගම ක්‍රියාකාරිකයකු, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගනු ලැබීම.**

මහනුවර පදිංචි ධනංජය රත්නායක, කොළඹ සිට පැමිණි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මාර්තු 04 වැනිදා පස්වරුවේ අත්අඩංගුවට ගැනිණි. 2022 මැයි 09 වැනිදා ඇඳිරි නීතිය කඩ කිරීම හා අයුතු ජනරාශිය යන චෝදනා යටතේ ඔහු අත්අඩංගුවට ගෙන ඇති අතර මාර්තු 05 වැනිදා මහනුවර මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඇප මත මුදාහැරිණි.

මූලාශ්‍රය: satahan.blog

04. **උද්ඝෝෂණවලදී භාවිත කරන කඳුළුගෑස්වල ප්‍රමිතිය හා ඒවා භාවිත කරන ආකාරය පිළිබඳව වාර්තාවක් සපයන ලෙස අධිකරණය පොලිසියට නියෝග කිරීම.**

ජාතික ජන බලවේගය ඉකුත් පෙබරවාරි 26 වැනිදා කොළඹ දී පැවැත් වූ විරෝධතාවට සහභාගි වූ එම පක්ෂයේ නිවිතිගල ප්‍රාදේශීය සභා අපේක්ෂක නිමල් අමරසිරිගේ මරණයට, පොලිසියේ කඳුළු ගෑස් ප්‍රහාර හේතු වූ බවට මියගිය අයගේ පාර්ශ්වයෙන් ඉදිරිපත් වූ චෝදනා සැලකිල්ලට ගෙන කොටුව මහේස්ත්‍රාත් තිළිණ ගමගේ එම නියෝගය නිකුත් කළේය.

ඒ අනුව එම කරුණු සම්බන්ධයෙන් සති 02 ක් ඇතුළත

වාර්තාවක් දෙන ලෙස මහජන සාමය, කළමනාකරණ කොට්ඨාසයේ අධ්‍යක්ෂවරයාට නියෝග කෙරුණු අතර, මාර්තු 26 වැනිදා එම වාර්තාව අධිකරණය වෙත ඉදිරිපත් කරන ලදි. අදාළ උද්ඝෝෂණයේදී භාවිත කෙරුණු කඳුළුගෑස් කල් ඉකුත් වූ ඒවා නොවන බවත්, එදින උද්ඝෝෂණය වායු බෝම්බ 26ක් සහ කඳුළුගෑස් උණ්ඩ 85ක් නිකුත් කළ බවත් එම වාර්තාවෙහි දැක්වේ.

මූලාශ්‍ර: vivaranews.com, sinhala.adaderana.lk

05. **ඇමති බන්දුල ගුණවර්ධනට හූ කියා විරෝධය පළ කළ පුද්ගලයකු අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීම.**

මාර්තු 25 වැනිදා හෝමාගම පිට්පන ප්‍රදේශයේ ආගමික උත්සවයකට සහභාගි වීමට ගොස් සිටි බන්දුල ගුණවර්ධන ඇමතිවරයාට හූ කියා විරෝධය පළ කළ ආර්.එම්.යූ චමින්ද දර්ශන නැමති පුද්ගලයකු පොලිසිය මගින් අත්අඩංගුවට ගැනිණි. අමාත්‍යවරයාට සමච්චල් කිරීම, ආගමික උත්සවයකට බාධා කිරීම, වන්දනාමාන කිරීමේ අයිතිය කඩ කිරීම යන චෝදනා මත ඔහු හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන ලදුව, රුපියල් ලක්ෂය බැගින් වූ ශරීර ඇප දෙකකක් මත මුදාහැරීමට මහේස්ත්‍රාත්වරිය නියෝග කළාය. තමන් ආගමික කටයුත්තකට විරෝධය නොදැක්වූ බවත්, රට අර්බුදයක තිබියදී ඇමතිවරුන් උත්සව පැවැත්වීමට විරෝධය පළ කිරීමක් ලෙස හූ කී බවත් විත්තිකරු අධිකරණය හමුවේ ප්‍රකාශ කර තිබේ. නඩුව, අගෝ. 24 වැනිදා යළි කැඳවීමට නියමිතය.

මූලාශ්‍රය: mawratanews.lk

06. **ගෝඨාගෝගමට සහ මයිනාගෝගමට පහරදීම සම්බන්ධයෙන් දේශබන්දු තෙන්නකෝන් සැකකරුවකු ලෙස නම් කරන්නැයි ඉල්ලා අභියාචනාධිකරණය හමුවේ ගොනු කර තිබූ පෙත්සම නිෂ්ප්‍රභ කිරීම.**

2022 මැයි 9 වැනිදා අරලියගහ මන්දිරයට රැස් වූ පොදුජන පෙරමුණේ ක්‍රියාකාරිකයන් විසින් අරලියගහ මන්දිරය ඉදිරිපිට මයිනාගෝගම සහ ගාලුමුවදොර ගෝඨාගෝගම විරෝධතාකරුවන්ට පොලු මුගුරුවලින් පහරදීමේ සිද්ධිය වැළැක්වීමට නිසි පියවර නොගැනීම සම්බන්ධයෙන් ඔහු අත්අඩංගුවට කරන්නැයි නියෝග කරන ලෙස ඉල්ලමින් මෙම පෙත්සම ගොනු කර තිබිණි. නීතිඥ රාමලිංගම් රංජන් මහතා මගින් ඉදිරිපත් කෙරුණු මෙම පෙත්සම, අභියාචනාධිකරණයේ සභාපති විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න සහ ඒ. මරික්කාර් යන විනිසුරුවරුන් හමුවේ විභාග කෙරිණි.

මූලාශ්‍රය: www.youtube.com

07. **වසන්ත මුදලිගේ නිදහස් කිරීමට එරෙහිව නීතිපතිවරයා මහාධිකරණයට අභියාචනයක් ගොනු කිරීම.**

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ දිගු කලක් රක්ෂිත බන්ධනාගාරගත කර සිටි අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු වසන්ත මුදලිගේ නිදහස් කිරීමට කොළඹ මහේස්ත්‍රාත්වරයා ලබා දුන් තීන්දුව නීතියට පටහැනි යැයි තීරණය කොට එය ප්‍රතිශෝධනය කරන ලෙස මෙම අභියාචනයෙන් ඉල්ලා තිබේ. මෙම අභියාචනය මාර්තු 27 වැනිදා කැඳවූ අතර එය නැවත අප්‍රේල් 3 වැනිදා කැඳවන ලෙස කොළඹ මහාධිකරණය නියම කළේය.

මූලාශ්‍රය: www.youtube.com

## ව්‍යුහාත්මක කොන්දේසි

**මාධ්‍ය පද්ධතියේ සමස්ත ව්‍යුහයට මෙන්ම මාධ්‍ය නිදහස සක්‍රිය කරන සමස්ත පරිසරයට අදාළ වන විභව දර්ශක 6ක් මෙම සංරචකයට ඇතුළත්ය. රාජ්‍ය මාධ්‍යයක් වන රූපවාහිනී සංස්ථාවේ පැවැත්ම සම්බන්ධයෙන් උද්ගත වී තිබෙන අර්බුදය, මෙම සංරචකය යටතට ගැනෙන, විවිධ වර්ගයේ මාධ්‍යවල පැවැත්ම හා මහජන සේවා විකාශන ආකෘතිවල පැවැත්ම යන දර්ශක යටතට ගැනෙන වැදගත් කරුණකි. 'අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය' යන දර්ශකයට අයත් වන සිදුවීම් 3ක්ද මෙහි ඇතුළත් වේ. කඳුළුගෑස් භාවිතය, ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ භාෂණයේ නිදහසට එරෙහිව සුලබව භාවිත කෙරෙන තත්ත්වයක් මෑත වකවානුව තුළ පෙන්නුම් කළ අතර, පසුගිය මාසය තුළ ඒ පිළිබඳ වැදගත් මැදිහත්වීම් රැසක් සිවිල් සමාජය හා නීතිමය පාර්ශ්වවලින් සිදු විය.**

**4 වගුව: 2023 මාර්තු: ව්‍යුහාත්මක කොන්දේසි - සිදුවීම් 04**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| විවිධ වර්ගයේ මාධ්‍ය ආකෘතිවල පැවැත්ම/ මහජන සේවා විකාශන ආකෘතිවල පැවැත්ම | 01 |
| අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය | 03 |
| **එකතුව** | **04** |

01. **ශ්‍රී ලංකාවේ අදහස් පළ කිරීමේ නිදහසට එරෙහි ප්‍රමුඛ අවියක් වන කඳුළුගෑස් භාවිතය පිළිබඳ පර්යේෂණ වාර්තාවක්, සමාජය හා සාමයික කේන්ද්‍රය (CSR) විසින් එළිදැක්වීම.**

සමාජය හා සාමයික කේන්ද්‍රයේ පර්යේෂණ කණ්ඩායමක් විසින් කළ පර්යේෂණයක් පදනම් කරගත් මෙම වාර්තාව 'කඳුළු ගෑස් මිලියන විසිගණනක කඳුළු' යනුවෙන් නම් කර තිබේ. මෙම පර්යේෂණය සඳහා තොරතුරු දැනගැනීමේ අයිතිය භාවිතයෙන් ආරක්ෂක අංශ වෙතින් දුෂ්කර පරිශ්‍රමයක් ඔස්සේ ලබාගත් තොරතුරු හා මේ විෂය සම්බන්ධ අන්තර්ජාතිකව සිදු කර ඇති පර්යේෂණ තොරතුරුද එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මාර්ගෝපදේශද අදාළ කර ගෙන ඇත. මාර්තු 7 වැනිදා මරදාන සමාජ හා සාමාජය හා සාමයික කේන්ද්‍රයේදී වාරතාව එළිදැක්විණි.

මූලාශ්‍රය: www.bbc.com

02. **උද්ඝෝෂණ විසුරුවාහැරීම සඳහා පොලිසිය භාවිත කරන කඳුළු ගෑස් සහ ජලයේ ප්‍රමිතිය පිළිබඳව පිළිතුරු අපේක්ෂාවෙන් ප්‍රශ්නාවලි දෙකක් නීතිඥ කණ්ඩායමක් විසින් පොලිස් මූලස්ථානය වෙත භාර දීම.**

පොලිසිය උද්ඝෝෂණ විසුරුවාහැරීම සඳහා කල් ඉකුත් වූ කඳුළුගෑස් භාවිත කරන බවට බරපතළ චෝදනා පවතින අතර, මාර්තු මාසයේ දින තුනක් ඇතුළත කඳුළුගෑස් ප්‍රහාර හේතුවෙන් දෙදෙනෙකු මියගොස්, එක් අයකු අසාධ්‍ය තත්ත්වයට පත්ව ඇති බවත්, 28 දෙනෙකු රෝහල්වලින් ප්‍රතිකාර ලබාගෙන ඇති බවත් මෙම නීතිඥ කණ්ඩායමේ සාමාජිකයකු වන සුනිල් වටගල ප්‍රකාශ කළේය. ඉදිරිපත් කළ ප්‍රශ්නමාලාවට ලැබෙන පිළිතුරු මත ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට එම නීතිඥ කණ්ඩායම අපේක්ෂා කරයි.

මූලාශ්‍රය: MFRM Desk

03. **මෑතකදී පැවැත්වුණු මහජන උද්ඝෝෂණවලදී එල්ල කළ කඳුළුගෑස් ප්‍රහාර සම්බන්ධයෙන් තොරතුරු දැනගැනීමේ පනත යටතේ පොලිස් මූලස්ථානයෙන් තොරතුරු ඉල්ලා සිටීම.**

සමාජවාදී තරුණ සංගමය නියෝජනය කරමින් එහි ජාතික කමිටු සාමාජිකා, නීතිඥ ශානිකා ද සිල්වා ඇතුළු පිරිසක් විසින් මාර්තු 10 වැනිදා මෙම තොරතුරු ඉල්ලීම් ඉදිරිපත් කරන ලදි. 2007 අංක 58 දරන රසායනික අවි සම්මුති පනතේ 19 G1 වගන්තිය යටතේ කඳුළුගෑස් තහනම් අවියක් ලෙස සැලකෙන බවත් ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කරන බවත් ඇය ප්‍රකාශ කරයි.

මූලාශ්‍රය: www.youtube.com

04. **ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සේවකයින්ට ස්වේච්ඡාවෙන් ඉල්ලා අස්වීම සඳහා වැඩපිළිවෙළක් ප්‍රකාශයට පත් කිරීම.**

වසර 42ක කාලයක් රාජ්‍ය සංස්ථාවක් ලෙස පවත්වාගෙන ආ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ලාභ ලබන ආයතනයක් ලෙස පවත්වාගෙන යෑමේ අභියෝගයකට මුහුණ දී සිටින බැවින් මෙම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන බව, අධ්‍යක්ෂ ජෙනරාල්වරයා විසින් නිකුත් කළ නිවේදනයෙහි සඳහන් කර තිබේ.

ඒ අනුව ස්වේච්ඡාවෙන් සේවයෙන් ඉවත් වන්නන් සඳහා පදනම් දෙකක් ඉදිරිපත් කර ඇති අතර, සේවා කාලය අනුව රු. ලක්ෂ 2.5 සිට ලක්ෂ 25 දක්වා මුදලක් වන්දි ලෙස ලබා දීමට සැලසුම් කර ඇත.

මූලාශ්‍රය: ceylonnewsfactory.lk

**5 වගුව: මාධ්‍ය නිදහස: 2023 ජනවාරි - මාර්තු දක්වා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වී ඇති සිදුවීම්.**

| **ආවරණය කර ඇති සංරචකය** | **2023 ජනවාරි - පෙබරවාරි** | | **2023 මාර්තු** |
|---|---|---|---|
| | නව සිදුවීම් | පෙර සිදුවීම්වල වර්ධනයන් | |
| ආරක්ෂාව හා සුරක්ෂිතබව | 04 | - | 10 |
| නීතිමය කොන්දේසි | 19 | 02 | 07 |
| මාධ්‍යයේ ස්වාධීනත්වය | - | - | - |
| වෘත්තීයවේදීත්වය | 01 | - | - |
| ව්‍යුහාත්මක කොන්දේසි | 03 | - | 04 |
| **එකතුව** | **27** | **02** | **21** |

පසුගිය මාධ්‍ය නිදහස මාසික වාර්තා මෙතැනින් බලන්න

**පසුසටහන:** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු  සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවී සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවක් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම  මාසික වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදී නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.


## Free Media Movement

Convener: Lasantha De Silva  +94 71 166 7938, +94 77 810 7620 | Secretary: Hana Ibrahim +94 77 741 2995
Treasurer:  Ananda Jayasekara +94 77 312 4850
No 96, Bernard Soysa Mw, Colombo 05.  Tel: +94 112368895 Fax: +94 112368895;
Web: www.fmmsrilanka.lk, www.mediareform.lk
Email: fmmsrilanka@gmail.com|Facebook: https://www.facebook.com/fmm.srilanka
Twitter: https://twitter.com/FMMsrilanka|#FMM25


Layout: Nalinda Seneviratne